සියලුම හිමිකම් ඇවිරිනි / All Rights Reserved

# Royal College - Colombo 07

රාජකීය විද්‍යාලය - කොළඹ 07

## Grade 11 – Pre-Evaluation Test – November 2020

පෙරහුරු පරීක්ෂණය - 2020 නොවැ. - 11 ශ්‍රේණිය

කාලය : පැය 1
Time :1 hour

| 11 | S | I |
|---|---|---|

## Buddhism – I

බුද්ධ ධර්මය – I

Name :- .................................................... Grade : -................ Index number:-....................

- ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.
- වඩාත් නිවැරදි පිළිතුරට හිමි වරණය තෝරා (x) ලකුණ යොදන්න.
- අපහැදිලි පිළිතුර කපා හරිනු ලැබේ

1. වීර්ය පාරමිතාවට අදාළ වන උත්සාහය බෙදා දැක්විය හැකි පියවර ගණන කීය ද?
   (1) 2 කි. (2) 4 කි. (3) 5 කි. (4) 6 කි.

2. ලෝකය පිළිබඳ දත යුතු සියල්ල මැනවින් අවබෝධ කරගත් හෙයින් බුදුරජාණන් වහන්සේ,
   (1) සුගත නම් වන සේක. (2) විජ්ජාචරණ සම්පන්න නම් වන සේක.
   (3) ලෝකවිදූ නම් වන සේක. (4) සම්මා සම්බුද්ධ නම් වන සේක.

3. පටිච්ච සමුප්පාදයේ, ''සිතින් දැඩිව අල්ලා ගැනීම'' හැඳින්වෙන්නේ,
   (1) නාම රූප නමිනි. (2) විඤ්ඤාණ නමිනි.
   (3) භව නමිනි. (4) උපාදාන නමිනි.

4. බුදුරජාණන් වහන්සේ අටවන වස් කාලය ගත කළේ,
   (1) මකුල පර්වතයෙහි ය. (2) චාලිය පර්වතයෙහි ය.
   (3) භේෂකලා පර්වතයෙහි ය. (4) විශාලා මහනුවර කූඨාගාර ලෙනෙහි ය.

5. ඒදඬු පාලම් ආදිය ඉදිකිරීම නිසා දිවා රෑ පිං වැඩේ. ඒ පිළිබඳ කරුණු දක්වා ඇති සූත්‍ර දේශනාව වන්නේ,
   (1) වනරෝප සූත්‍රය යි. (2) ව්‍යග්ඝපජ්ජ සූත්‍රය යි.
   (3) සිඟාලෝවාද සූත්‍රය යි. (4) මහා මංගල සූත්‍රය යි.

6. ගිරිමානන්ද සූත්‍රයේ සඳහන් වන ආකාරයට රෝග ඇතිවීමට බලපාන හේතු,
   (1) 8 කි. (2) 10 කි. (3) 12 කි. (4) 14 කි.

7. පළමු වන ධර්ම සංගායනාවේ දී ''ධර්මය - විනය'' මුඛ පරම්පරාවෙන් පවත්වාගෙන යෑමේ දී, ආනන්ද හිමියන් ඇතුළු ශිෂ්‍ය පරම්පරාවට පවරනු ලැබුවේ,
   (1) සංයුක්ත නිකාය යි. (2) මජ්ඣිම නිකාය යි.
   (3) අංගුත්තර නිකාය යි. (4) දීඝ නිකාය යි.

සියලුම හිමිකම් ඇවිරිනි / *All Rights Reserved*

8. කව්සිළුමිණ රචනා කිරීම සඳහා පාදක කරගත් ජාතක කතාව වන්නේ,
   (1) ගුත්තිල ජාතක කතාව යි. (2) කුස ජාතක කතාව යි.
   (3) වෙස්සන්තර ජාතක කතාව යි. (4) මඛාදේව ජාතක කතාව යි.

9. අවුකන ප්‍රතිමාව හා ගල් විහාර ප්‍රතිමාව තුළ දක්නට ලැබෙන මුද්‍රාව වන්නේ,
   (1) අභය මුද්‍රාව යි. (2) ධ්‍යාන මුද්‍රාව යි.
   (3) භූමිස්පර්ශ මුද්‍රාව යි. (4) විතර්ක මුද්‍රාව යි.

10. ''අනවජ්ජානි කම්මානි'' යනු නිවැරදි රැකියාවන් කිරීමයි. මෙය සඳහන් සූත්‍ර දේශනාව වන්නේ,
    (1) පත්තකම්ම සූත්‍රය (2) සිඟාලෝවාද සූත්‍රය
    (3) මහා මංගල සූත්‍රය (4) අණන සූත්‍රය

11. බෞද්ධ කලා ශිල්ප අතර ''වාහල්කඩ'' ට හිමි වනුයේ සුවිශේෂී ස්ථානයකි. ඒ අනුව වර්තමානයේ දැකිය හැකි කලාත්මක වහල්කඩ පිහිටා තිබෙන්නේ,
    (1) ථූපාරාම චෛත්‍යය අසල ය.
    (2) රුවන්වැලි සෑය අසල ය.
    (3) මිහින්තලය කණ්ඨක චෛත්‍යය අසල ය.
    (4) අභයගිරි චෛත්‍යය අසල ය.

12. තමන් පන්තියේ පළමුවැනියා වීම ගැන ඔහුගේ යහළුවා වූ නිමල් සතුටට පත් විය. මෙකී ගුණාංගය අදාළ වන්නේ,
    (1) මෙත්තා ගුණය යි. (2) කරුණා ගුණය යි.
    (3) මුදිතා ගුණය යි. (4) උපෙක්ඛා ගුණය යි.

13. ''කර්මයෙන් සියල්ල සිදු නොවේ.'' යන ඉගැන්වීම පැහැදිලි කිරීම සඳහා ඉදිරිපත් කල හැකි සාධකයක් වන්නේ,
    (1) දිට්ඨ ධම්මවේදනීය කර්මය යි. (2) කටත්තා කර්මය යි.
    (3) ජනක කර්මය යි. (4) ගති සම්පත්තිය යි.

14. මිනිසුන්ගේ අංග ලක්ෂණ බලා ඔවුන් හඳුනාගැනීමේ හැකියාවක් තිබූ බුද්ධ කාලයේ සිටි බමුණෙකි,
    (1) සෝණදණ්ඩ බමුණා (2) පොට්ඨපාද බමුණා
    (3) චංකී බමුණා (4) ද්‍රෝණ බමුණා

15. විවිධ සංස්කෘතීන්ට ගරු කරමින් අන්‍ය ජාතිකයන් හා අන්‍ය ආගමිකයන් සමග සහයෝගයෙන් කටයුතු කිරීම බුදු දහමේ හඳුන්වන්නේ,
    (1) සහජීවනය යනුවෙනි. (2) පරාර්ථකාමී බව යනුවෙනි.
    (3) සිතා විමසා කටයුතු කිරීම යනුවෙනි. (4) දන්දීමට යොමුවීම යනුවෙනි.

සියලුම හිමිකම් ඇවිරිනි / *All Rights Reserved*

16. සමාජය තුළ දැකිය හැකි පුද්ගල විෂමතාවට හේතුව කුමක්දැයි බුදුරජාණන් වහන්සේගෙන් විමසා සිටියේ,

(1) පොට්ඨපාද බමුණා ය. (2) තෝදෙය්‍ය පුත්‍ර සුභ නම් බමුණා ය.

(3) වාසෙට්ඨ බමුණා ය. (4) දීඝජානු කෝලිය පුත්‍රයා ය.

17. දේව ආරාධනාව ලැබූ බෝසතුන් මව්කුස පිළිසිඳ ගැනීමට පංච මහ විලෝකනය මගින් පූර්ව අධ්‍යයනයක් කරනු ලැබූයේ ය. එයින් කෙනෙකුගේ ජීවිතයට ගත හැකි ආදර්ශය නම්,

(1) කිසිවෙකුට අවනත නොවිය යුතු ය යන්න යි.

(2) අන් අයගේ උදව් උපකාර ලබාගත යුතු බව යි.

(3) සිතා විමසා බලා කටයුතු කළ යුතු ය යන්න යි.

(4) තමාගේ අවශ්‍යතාවය අනුව කටයුතු කළ යුතු ය යන්න යි.

18. කුමාර අවධියේ දී සර්වමිත්‍ර ගුරුතුමාගෙන් රජ කුමාරයකුට අවශ්‍ය ශිල්ප උගත්තේ ය. තාපස අවධියේ අෂ්ඨ සමාපත්තිලාභී ගුරුවරයා වූයේ,

(1) භග්ගව තවුසානෝ ය. (2) උද්දකරාමපුත්ත තවුසානෝ ය.

(3) අසිත තවුසානෝ ය. (4) ආලාරකලාම තවුසානෝ ය.

19. සංඝරත්නය විසින් බොහෝ ශාසනික සමාජ සේවාවන් රැසක් ඉටු කරයි. සංඝරත්නයේ ගුණ අතරට අයත් නොවන්නේ,

(1) ආහුනෙය්‍යය (2) පාහුනෙය්‍යය (3) දක්ඛිනෙය්‍යය (4) ඒහිපස්සික

20. ලාභ-අලාභ, යස-අයස, නින්දා-ප්‍රශංසා, සැප-දුක හා අටලෝ දහමින් කම්පා නොවීම,

(1) අරහං බුදු ගුණය යි. (2) තාදී ගුණය යි.

(3) අසරණ සරණ ගුණය යි. (4) පුරිසදම්මසාරථී ගුණය යි.

21. තණ්හාවෙන්, මානයෙන් හා මිත්‍යා දෘෂ්ටියෙන් තොරව කරුණාව හා උපාය කෞශල්‍යයෙන් යුතුව පුරණ ගුණධර්ම සමූහය,

(1) දස පුණ්‍ය ක්‍රියා නම් වේ. (2) දස කුසල් නම් වේ.

(3) දස පාරමිතා නම් වේ. (4) මේ සියල්ලම වේ.

22. දුක්ඛ දුක්ඛතා, විපරිණාම දුක්ඛතා හා සංඛාර දුක්ඛතා ලක්‍ෂණ මුල් කරගත් සත්‍යය,

(1) දුක්ඛ සත්‍යය (2) දුක්ඛ සමුදය සත්‍යය

(3) දුක්ඛ නිරෝධ ආර්ය සත්‍යය (4) දුක්ඛ නිරෝධ ගාමිණී පටිපදා ආර්ය සත්‍යය

23. මංගල ධර්ම දේශනාව සඳහා බුදුරජාණන් වහන්සේ වැඩම කළේ,

(1) වේළුවනාරාමයට (2) ඉසිපතනාරාමයට

(3) ජේතවනාරාමයට (4) පූර්වාරාමයට

සියලුම හිමිකම් ඇවිරිනි / All Rights Reserved

24. දැනට ඉතිරිව ඇති ඓතිහාසික බෝධිසරය පිහිටා ඇත්තේ,
(1) අනුරාධපුරයේ ය. (2) මහනුවර ය.
(3) තිල්ලක්ගම ය. (4) කැලණියේ ය.

25. බුද්ධ ධර්මය විෂයභාර ගුරුතුමිය, සිසුන්ට ලබාදුන් අදහස් පත්‍රිකාවකට එක් සිසුවෙකු දක්වූ ප්‍රතිචාර පහත දක්වේ.
මම නිති පෝදා පන්සල් යමි. මම ධර්මය ඇසීමට කැමැත්තෙමි.
මම සිල්වතුන් දකීමට කැමැත්තෙමි. මම භික්ෂූන්ට ගෞරව දක්වමි.
මම පිරිත් ඇසීමට කැමැත්තෙමි.

මෙම ගති ලක්ෂණ අනුව ඉහත ශිෂ්‍යයා තුළ,
(1) විමර්ශනශීලී බව දකිය හැකි ය. (2) තාර්කික බව දකිය හැකි ය.
(3) ගතානුගතික බව දකිය හැකි ය. (4) ශ්‍රද්ධාවන්ත බව දකිය හැකි ය.

26. සමථ භාවනාව තුළින් ඉටුවන කාර්යය වනුයේ,
(1) කෙලෙස් මුල් මුලින් ම උදුරා දැමීම ය.
(2) නිවන් දකීමට උපකාරී වීම ය.
(3) රාග, ද්වේශ, මෝහ ආදී කෙලෙස් යටපත් කිරීම ය.
(4) සංසාරගත දුකින් මිදීම ය.

27. අසත්පුරුෂයන්ට ප්‍රියවීම, නිදනසුළු බව, ක්‍රෝධ කරන බව, ස්ත්‍රී ලොල් බව ආදී කරුණු ඇතුළත් සූත්‍ර දේශනාව වන්නේ,
(1) පරාභව සූත්‍රය යි. (2) කාලාම සූත්‍රය යි.
(3) රතන සූත්‍රය යි. (4) මංගල සූත්‍රය යි.

28. දුටුගැමුණු රජතුමා විසින් ඉදිකරන ලද මහල් නවයකින් යුක්ත ගොඩනැගිල්ල හඳුන්වන්නේ,
(1) රත්න ප්‍රාසාදය නමිනි. (2) රත්නමාලී චෛතිය නමිනි.
(3) ලෝවාමහා ප්‍රාසාදය නමිනි. (4) බිසෝ මාළිගය නමිනි.

29. බුදු දහමට අනුව මිනිසුන්ගේ සචේතනික ක්‍රියාවන් ක්‍රියාත්මක වන දොරටු ගණන වනුයේ,
(1) 2 කි. (2) 4 කි. (3) 6 කි. (4) 3 කි.

30. ''ඉමස්මිං අසති ඉදං න හෝති'' මෙම පාලි පාඨයේ සිංහල අරුත ප්‍රකාශ වන පිළිතුර අයත් වරණය තෝරන්න.
(1) මෙය නැතිවී යාමෙන් වැය නැතිව යයි. (2) මෙය ඇති කල්හි මෙය වෙයි.
(3) මෙය ඉපදීමෙන් මෙය උපදී. (4) මෙය නැති කල්හි මෙය නොවේ.

31. ''අයමන්තිමා ජාති නත්ථිදානි පුනබ්භවෝ'' යන පාඨය ප්‍රකාශ කළ අවස්ථාව වන්නේ,
(1) රාහුල කුමරු උපන් අවස්ථාවේ ය. (2) උයන් කෙළි නරඹා එන අවස්ථාවේ ය.
(3) සිදුහත් උපත සිදු වූ අවස්ථාවේ ය. (4) බුදු වූ අවස්ථාවේ ය.

සියලුම හිමිකම් ඇවිරිනි / All Rights Reserved

32. අප මහා බෝසතාණෝ ශීල පාරමිතාව පිරූ ආකාරය මැනවින් ප්‍රකට වන ජාතක කතාව වනුයේ,
    (1) වෙස්සන්තර ජාතකය (2) සීල විමංස ජාතකය
    (3) අපණ්ණක ජාතකය (4) සඳකිඳුරු ජාතකය

33. චෛත්‍ය පිළිබඳ තොරතුරු සඳහන් වන ග්‍රන්ථය,
    (1) මහාවංශය (2) බෝධිවංශය (3) ථූපවංශය (4) චූලවංශය

34. උරුවෙල කාශ්‍යප ඇතුළු සහෝදරයන් තිදෙනාට ධර්මාවබෝධය ලබාදීමට බුදුරජාණන් වහන්සේ ඔවුන් විසූ ප්‍රදේශයට වැඩම කළහ. මේ පිරිස හැඳින්වෙන නිවැරදි ප්‍රකාශ වන්නේ,
    (1) උරුවෙල ජනපදයේ ජටිල යන්න යි. (2) විශාලා මහනුවර ආජීවක යන්න යි.
    (3) සේනානි නුවර ජටිල යන්න යි. (4) උරුවෙල ජනපදයේ නිගණ්ඨ යන්න යි.

35. ගතානුගතිකත්වයෙන් ද තර්කනය හා න්‍යාය වැනි බුද්ධිවාදී පෙළඹවීම්වලින් ද පුද්ගලයින් ප්‍රමාණත්වයෙන් ගැනීම ආදියෙන් තොරව සහේතුක ව, සාධාරණ ව, නිදහස් ව සිතා විමසා තීරණ ගැනීමට බුදුන් වහන්සේ දේශනා කළ සූත්‍රය,
    (1) මංගල සූත්‍රය යි. (2) කාලාම සූත්‍රය යි.
    (3) වසල සූත්‍රය යි. (4) පරාභව සූත්‍රය යි.

36. ලොව පුරා බුදුදහම ප්‍රචලිත කිරීම සඳහා එංගලන්තයේ ලන්ඩන් බෞද්ධ මධ්‍යස්ථානය, කල්කටාවේ ධර්මරාජික මහා විහාරය, බරණැස මූලගන්ධකුටි මහා විහාරය, බුද්ධගයාව වැනි බෞද්ධ මධ්‍යස්ථාන ඉදි කළේ,
    (1) හෙන්රි ස්ටීල් ඕල්කට්තුමා ය. (2) ශ්‍රීමත් අනගාරික ධර්මපාලතුමා ය.
    (3) පූජ්‍ය මිගෙට්ටුවත්තේ ගුණානන්ද හිමි ය.(4) පූජ්‍ය රේරුකානේ චන්දවිමල හිමි ය.

37. ''අසවලා මට බැන්නේ ය, මට පහර දුන්නේ ය, මා පැරදවූවේ ය, මා සතු දෙය පැහැරගත්තේ ය.'' මෙම අදහස ඇතුළත් ධම්මපද ගාථාවේ මුල් පද දෙක වන්නේ,
    (1) ''නතං කම්මං කතං සාධු - යං කත්වා අනුතප්පති'' යන්න යි.
    (2) ''සුකරානි අසාධූනි අත්තනෝ අහිතානි ච'' යන්න යි.
    (3) ''අක්කොච්ඡිමං අවධි මං අජිනි මං අහාසිමෙ'' යන්න යි.
    (4) ''අචරිත්වා බ්‍රහ්ම චරියං අලද්ධා යොබ්බනේ ධනං'' යන්න යි.

38. මහා මංගල සූත්‍රයේ දැක්වෙන පරිදි මංගල කාරණු අතර අයත් නොවන්නේ පහත කවරක් ද?
    (1) පිදිය යුත්තන් පිදීම (2) දරුවන්ට සංග්‍රහ කිරීම
    (3) ඉවසීම (4) ලද දෙයින් සතුටු නොවීම

39. තණකොළ ගස පවා ආරක්ෂා කරන ලෙස බුදුරජාණන් වහන්සේ උපදෙස් දෙන ලද්දේ,
    (1) උපාසක පිරිසට ය. (2) සාමණේර භික්ෂූන්ට ය.
    (3) උපාසිකා පිරිසට ය. (4) උපසපන් භික්ෂූන්ට ය.

40. රිදී විහාරය, බඹරගල විහාරය, දෙගල්දොරුව විහාරය ආදී විහාරයන් හි සිතුවම් අයත් වන්නේ,
    (1) මහනුවර යුගයට ය. (2) කුරුණෑගල යුගයට ය.
    (3) පොළොන්නරු යුගයට ය. (4) අනුරාධපුර යුගයට ය.

(ලකුණු 1 x 40 = 40)

සියලුම හිමිකම් ඇවිරිනි / All Rights Reserved

# Royal College - Colombo 07

රාජකීය විද්‍යාලය - කොළඹ 07

## Grade 11 – Pre-Evaluation Test – November 2020

පෙරහුරු පරීක්ෂණය - 2020 නොවැ. - 11 ශ්‍රේණිය

කාලය : පැය 2
Time :2 hours

| 11 | S | II |
|---|---|---|

## Buddhism – II

## බුද්ධ ධර්මය – II

Name :- ................................................... Grade : -................ Index number:-....................

❖ **පළමු ප්‍රශ්නය ඇතුළු ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.**

❖ **පළමු ප්‍රශ්නයට ලකුණු 20 ක් ද අනෙක් ප්‍රශ්නයකට ලකුණු 10 බැගින් ද හිමි වේ.**

❖ **ප්‍රශ්න අංකය හා අනු අංක පැහැදිලිව සටහන් කරන්න.**

❖ **සෑම ප්‍රශ්නයක් අලුත් පිටුවකින් ආරම්භ කරන්න.**

(1) (i) කාකමාසක හා භුත්තවමිතක යන්නෙහි තේරුම් ලියන්න.

(ii) බුදුරදුන් පාරිලෙය්‍ය වනයෙහි වස් විසුවේ කිනම් වස් කාලයේ ද?

(iii) බෞද්ධ නො වන සියලු ආගමික සිද්ධාන්ත විග්‍රහ කොට බැහැරකිරීමට උපකාර වන බෞද්ධ ඉගැන්වීම වන්නේ කුමක් ද?

(iv) බුබ්බුලාකාර හා ඝණ්ඨාකාර හැඩයෙන් නිමවා ඇති ස්තූප දෙකක් නම් කරන්න.

(v) කර්මය හඳුන්වන නිබ්බේධික සූත්‍රයේ සඳහන් පාලි පාඨය ලියන්න.

(vi) බුද්ධ ප්‍රතිමා ප්‍රධාන වශයෙන් වර්ග තුනකට බෙදා දක්වේ. එයින් දෙකක් නම් කරන්න.

(vii) සමථ භාවනාවෙන් ලබාගත හැකි උසස්තම ඵල දෙක නම් කරන්න.

(viii) සම්මා දිට්ඨිය පස් ආකාරයකි. එයින් දෙකක් නම් කරන්න.

(ix) බුද්ධ දේශනාවේ සඳහන් පරිදි ස්තූපයකින් උපහාර ලද හැකි (ථූපහාර්ය) උතුමන් දෙදෙනෙක් නම් කරන්න.

(x) බුදු දහමට අනුව සත්වයා නිර්මාණය වී ඇත්තේ නාම රූප තුළිනි. ඒ අනුව රූපස්කන්ධය හා සංඛාරස්කන්ධය දක්වා ඇති උපමාවන් නම් කරන්න.

(2) (i) පුද්ගලයෙකු දැහැමිව ධනය උපයා ගන්නා ආකාරය සඳහන් වන සූත්‍ර දේශනා දෙකක් නම් කරන්න.

(ii) වෙළඳාම, ධනය උපයා ගන්නා එක් ක්‍රමයකි. වෙළඳාමේ දී අත්හළ යුතු කූටෝපක්‍රම තුනක් ලියන්න.

(iii) දැහැමිව උපයාගත් ධනය පරිභෝග කිරීමේ දී සමජීවිකතාව උපකාරී වේ. එයින් ඔබට ලැබෙන ප්‍රයෝජන මොනවාදැයි පැහැදිලි කරන්න.

සියලුම හිමිකම් ඇවිරිනි / All Rights Reserved

(3) (i) බුදුරජාණන් වහන්සේ අසරණ වූ පිරිස් සොයාගෙන වැඩම කොට අවශ්‍ය අනුග්‍රහය ලබාදීම කිනම් චාරිකා ගණයට අයත් වේ ද?

(ii) ''පුරිසදම්ම සාරථී'' බුදු ගුණයට නිදසුන් තුනක් දක්වන්න.

(iii) ශිෂ්‍යයන් වන අපගේ ශිෂ්‍ය ජීවිතය සාර්ථක කරගැනීම සඳහා බුදුරදුන්ගේ තාදී ගුණය ඉවහල් කරගත හැකි ආකාරය පැහැදිලි කරන්න.

(4) (i) ලෝවැඩ සඟරාවේ කතුවරයා සහ එය ලියැවුණු යුගය නම් කරන්න.

(ii) කෝට්ටේ යුගයේ රචිත සංදේශ කාව්‍ය අතරින් තුනක් නම් කරන්න.

(iii) බුදු දහමේ ආභාෂයෙන් සිංහල සාහිත්‍යය පෝෂණය වූ අයුරු පැහැදිලි කරන්න.

(5) (i) සිව්වැනි ථේරවාද සංගීතිය පැවැත් වූ ස්ථානය නම් කරන්න.

(ii) එම සංගායනාවේ දී සිදු වූ වැදගත් ශාසනික කටයුත්ත කුමක් ද?

(iii) එම ශාසනික කටයුත්ත බුද්ධ ධර්මයේ ආරක්ෂාවට හා දිගු කල් පැවැත්මට හේතු වූ ආකාරය පෙන්වා දෙන්න.

(6) (i) ගර්භයේ හැඩය අනුව චෛත්‍ය වර්ග ප්‍රධාන වශයෙන් ආකාර හයකි. ඉන් දෙකක් නම් කරන්න.

(ii) අංග සම්පූර්ණ චෛත්‍යයක දැකිය හැකි අංග තුනක් නම් කරන්න.

(iii) ස්තූපය ආශ්‍රිතව ඉදිකරන ලද සිංහල කලා නිර්මාණ පිළිබඳව පැහැදිලි කිරීමක් කරන්න.

(7) පහත සඳහන් මාතෘකාවලින් දෙකක් ගැන කෙටි සටහන් ලියන්න.

(i) අනගාරික ධර්මපාලතුමා

(ii) කර්මය

(iii) බෞද්ධ සාහිත්‍යය

(iv) මුරගල